# ගම්පහ අස්ගිරිය විහාරයෙන් හමු වූ ශිලාලේඛනය පිළිබඳ මූලික විමර්ශනයක්

කේ.එස්. ජයසූරිය[1], ඩබ්.එස්.ඩී. බොතේජු[2], අයි.ඩී.ආර්.එල්. ජයන්ත[3], බී.එම්.ආර්.වී. බණ්ඩාර[4]

පුරාවිද්‍යා අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය
[1]kasunjayasuriya9@gmail.com, [2]sithu.dil95@gmail.com,[4]rumalvindula1995@gmail.com

ප්‍රමුඛ පදඃ අස්ගිරිය රජමහා විහාරය, සෙල්ලිපි, උඩුගම්පොල රාජධානිය, ආර්ථිකය,සමාජය

## හැඳින්වීම

ගම්පහ අස්ගිරිය රජමහා විහාරයේ පිහිටා ඇත්තේ නූතන පළාත් බෙදීම අනුව බස්නාහිර පළාතේ වන අතර එය අයත් දිස්ත්‍රික්කය වනුයේ ගම්පහ දිස්ත්‍රික්කයයි. මෙම දිස්ත්‍රික්කයට අයත් පැරණි උඩුගම්පොළ රාජධානිය තුළ මෙම ගම්පහ අස්ගිරිය රජමහා විහාරය පිහිටා ඇත.

අස්ගිරිය විහාරය විහාරයේ නිරපේක්ෂ පිහිටීම වශයෙන් 07 07 53.0"N භ හා 79 58 47.1" Eපෙන්වාදිය හැකි ය. මෙම විහාරයේ සාපේක්ෂ පිහිටීම වනුයේ අංක 134/1 අස්ගිරිය උතුරු ග්‍රාම නිලධාරී වසම වශයෙන් දැක්විය හැකිය.අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා සාධක සහිත මෙම විහාරස්ථානය නුවර යුගයේ දී වැඩි ජනප්‍රියත්වයක් ලද බව කිව හැකි ය. මාලක ස්වරූපයට නිර්මාණය කර ඇති මෙම විහාරස්ථානය මාලක 3කමනිර්මාණය කර තිබේ.

මෙම විහාරස්ථානය සම්බන්ධ ඉතිහාසය අධ්‍යනයට සෙල්ලිපි හා පුරාවිද්‍යාත්මක සාධක උපරිම සහයෝගයක් දක්වන අතරජ් අතර මෙම විහාරය සතු ප්‍රදේශයේ සෙල්ලිපි 2කි. ඉන් එක් සෙල්ලිපියක් මහනුවර යුගයට අයත් බවට එහි අක්ෂර හා භාෂා විලාශය සැලකීමේදී උපකල්පනය කළ අතර අනෙක ක්‍රි.ව 5 වැනි සියවස දක්වා ඉතිහාසයකට අයත් ය. මෙහි දී අපගේ අවධානය යොමුවන සෙල්ලිපිය මෙම සෙල්ලිපියයි.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව වූයේ ගම්පහ අස්ගිරිය විහාරයේ ඉතිහාසය, අදාළ විහාරය ආශ්‍රිතව නූතනයේ පවතින පුරාවිද්‍යාත්මක සාක්ෂි මත හඳුනාගෙන ඇති කෝට්ටේ යුගයට හා මහනුවර යුගය අයත් විහාරයක් ම ද එසේත් නැතිනම් ජනවහරට අනුව මෙය අනුරාධපුර යුගයේ වළගම්බා රජසමෙහි නිර්මාණය වූ විහාරයක්ද යන්න හඳුනාගැනීමයි. මෙම විහාර භූමියෙන් හමුවන, මෙම පර්යේෂණය කරන කාලය වන විටත් අර්ථනකතනයක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සිදුකර නොතිබුණි. A.S.C.A.R වාර්තාවන්හි ක්‍රි.ව. 5 වැනි සියවසට කාලනිර්ණ කර තිබූ සෙල්ලිපිය අදාළ ප්‍රදේශයේ ඉතිහාසය අධ්‍යනය සඳහා සහයක් ලබා දෙන ලදී. මෙහිදී ප්‍රථමයෙන් අප මෙම සෙල්ලිපියෙහි පුවරු සටහන (stamp page) අධ්‍යනයේ යෙදුන අතර එහිදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ද අදාළ පුවරු සටහන් නොමැති වීම මත අපට එහි පුවරු සටහනක් ලබාගැනීමට සිදුවිය. ඒ අනුව මෙතෙක් කියවා නොතිබුණු මෙම සෙල්ලිපියෙහි අන්තර්ගතය හඳුනාගැනීමට හැකිවිය. එනම් රෙදි කර්මාන්ත ශාලාව වශයෙන් අර්ථකථනය කරගත හැකි විය.

මෙම පර්යේෂණයේ අරමුණ වූයේ ගම්පහ අස්ගිරිය රජමහා විහාරය ඇතුළු පැරණි උඩුගම්පොල රාජධානියේ ඉතිහාසය ක්‍රි.ව 5 වැනි සියවස දක්වා දිවයන්නේ ද එසේ නම් එම කාලයේ අදාළ ප්‍රදේශයේ ආර්ථික තත්ත්වය හා සමාජ තත්ත්වය කවර ආකාරයක් වූයේද යන්න අධ්‍යයනය කිරීමය. මේ ආශ්‍රිත ව අදාළ ප්‍රදේශය අවට ජනතාව වෙත යොමු කරනු ලැබූ ප්‍රශ්නාවලියක ආධාරයෙන් හා ගම්පහ දිස්ත්‍රික්කය ආශ්‍රිතව පිහිටා ඇති පුරාවිද්‍යාත්මක ස්ථානයන් ගවේෂණයක යෙදුනු අප වෙත ගම්පහ දිස්ත්‍රික්කයේ අතීත ආර්ථික තත්වයන් සමාජ තත්වයන් පිලිබඳව කරුණු අනාවරණය කරගත හැකි විය.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

මෙම ප්‍රදේශය හා සම්බන්ධ ජනශ්‍රැති පිළිබඳඅධ්‍යනයේ දී වළගම්බා රජු මෙම ප්‍රදේශය සැග වී සිටීමට යොදාගත් බවත් පසුව රාජ්‍යත්වයට පත්වීමෙන් අනතුරුව මෙම ප්‍රදේශයේ විහාරාරාම ඉදිකරන ලද බවත් පැවසේ. එසේම ජනවහරෙහි එන තවත් කරුණක් නම් ක්‍රිස්තු වර්ෂ මුල්භාගයේදී අස්ගිරිය විහාරය පිහිටා ඇති භූමියේ පහන් කණුවක් පිහිටා තිබූ බවත් අදාළ කාලයේ මෙම විහාර භූමිය ආසන්නයෙන් වැටී තිබූ මාර්ගයේ රාත්‍රී කාලයේ ගමන් ගත් ජනතාවට එම පහන් කණුව උපකාරී වූ බවත්ය. මීට සමාන තොරතුරු රැසක් මේ අවට මාලිගාතැන්න, වාරණ, පිළිකුත්තුව වැනි ස්ථානයන්හි ද ජනවහරට සම්බන්ධ ව ඇති අතර පිළිකුත්තුව හා වාරණ ආශ්‍රිතව හමුව ඇති සෙල්ලිපි අනුරාධපුර යුගය දක්වා ඈතට ගමන් කරයි. මෙම ප්‍රදේශය අනුරාධපුර යුගයෙහි දී පවා ජනාවාස ව තිබූ බවට සාධකයක් වේ. අපගේ අවධානය යොමුවන ගම්පහ අස්ගිරිය රජමහා විහාරය පිහිටි භූමියේ පැරණි බෝධිඝරයේ ඇති සෙල්ලිපි කොටස ක්‍රි.ව 3 - ක්‍රි.ව. 4 වැනි සියවස්වලට අයත් වේ.මෙම සෙල්ලිපිය සම්බන්ධ අක්ෂරයසැලකීමේදී පැහැදිලිව ම මෙම ප්‍රදේශය ක්‍රි.ව. 3 - ක්‍රි.ව. 4 වැනි සියවසට අයත් බව අවබෝධ කර ගත හැකිය. ඒ අනුව මෙම ප්‍රදේශය නිත්‍ය වශයෙන් ම ජනාවාසව ඇත්තේ ක්‍රි.ව. 3 - ක්‍රි.ව. 4 සියවස් අතර හෝ ඊට පෙර සමයන්හි වන්නට ඇති බවත් තහවුරු වේ. මෙම විහාර භූමිය සම්බන්ධ දැනට පිළිගත් මතය වන්නේ මෙම විහාරය කෝට්ටේ රාජධානි සමයේ උඩුගම්පොල රජකළ සකලකලා වල්ල රජු නිමවන ලද්දක් බවය. නමුත් මෙම සෙල්ලිපිය අනුව එම කරුණ වෙනස් වේ. එම හේතුවෙන් මෙම ප්‍රදේශයේ ඉතිහාසය පැහැදිලිව ම වෙනස් වේ.එසේම රෙදි කර්මාන්ත ශාලාවක් පැවතියේ වී නම් එම කාලසීමාව ආර්ථික වශයෙන් දියුණු කාලසීමාවක් බවටද අනාවරණය වේ. මෙම ප්‍රදේශය අනුරාධපුර සමයේවිශාල ජනතාවක් පැමිණි ප්‍රදේශයක් බවත් මෙය පැරණි ගමන්මාර්ගයක් හරහා වැටී තිබූ ස්ථානයක් වශයෙන්ද ජනප්‍රවාද අනුව පැහැදිලි වේ. මේ හා සම්බන්ධ තවත් ජනප්‍රවාදයක් වනුයේ නූතනය වනවිට වසාදමා ඇති අස්ගිරිය විහාරයේ දෙවැනි මාලකයේ ඇති උමන් මාර්ගය හා මාලිගාතැන්න විහාරයේ ඇති උමන් මාර්ගය එකිනෙක සම්බන්ධ වූ බවත් විශ්වාස කරනු ලැබේ. නමුත් අවාසනාවට කාරණය නම් නූතනය වන විට මෙම උමන් මාර්ග දෙකම වැසීගොස් පැවතීමයි.

මෙම ප්‍රදේශ සම්බන්ධ ව තොරතුරු දක්වන වැදගත් කෘතියක් වශයෙන් අලකේශ්වර යුද්ධය කෘතිය දැක්විය හැකිය. එම කෘතියෙහි අන්තර්ගත කරුණු පහත පරිදි වේ.

"ඉක්බිති යුවරජ තනතුර ලත් සකලකලා වල්ල රජු මහ රජකමට සුදුසු හෙයින් මන්ත්‍රීවරුන් හා මහ සේනාවගෙන් ජයවර්ධනපුරයට වැඩමවා ගෙන ඇවිත් සිංහාසනාප්‍රාප්ත වන ලෙසට සැලකල තැන සකලකළා වල්ල රජ තෙම කාරණා කීපයක් කල්පනා කොට වදාරා තමන්ගේ

මලනුවන් ගෙන්වා සිත්හාසනාප්‍රාප්ත කොට විජයබාහු නම් තබා මහ සේනාව හා රාජ්‍ය භාර කොට උඩුගම්පොළනුවරට වැඩි සේක."

ඒ අනුව ක්‍රි.ව 16 වැනි සියවසේ මෙම ප්‍රදේශය ජනාකීර්ණ පැවති බවත් එසේ නොවේ නම් සකලකලා වල්ල රජු සිය රාජ්‍යත්වය පවා අතහැර මෙම ප්‍රදේශයේ පාලනය භාරගැනීම සිදු නොවනු ඇත. එසේම නූතනයේ අස්ගිරිය විහාරයේ දක්නට ලැබෙන පැරණි ප්‍රතිමා ගෘහය සහිත ලෙන පූර්ව ඓතිහාසික යුගයට අයත් බව මහාචාර්ය සේනක බණ්ඩාරනායකයන් ප්‍රකාශ කර ඇති අතර ඒ අනුව සැලකීමේදී පිළිකුත්තුව,මඩබාවිට හා සමනබැද්ද යන විහාරයන් හි ඇති ලෙන් ද සමකාලීන වන බව පෙන්වාදිය හැකිය. එසේම මෙම ප්‍රතිමා ගෘහය සැලකීමේ දී එහි නිර්මාණ ලක්ෂණ ලන්දේසි සමයට අයත් බවත් මෙහි වන සිතුවම් මහනුවර යුගයට අයත් බවත් පෙනෙන්නට තිබේ. ඒ අනුව අස්ගිරිය විහාරයේ ඉතිහාසය අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා ව්‍යාප්ත ව පැවති බවත්, එසේ නම් අදාළ ප්‍රදේශය මෙම කාල වකවානුව තුළ ආර්ථික හා සමාජීය වශයෙන් දියුණු තත්වයක පැවතී බව පෙන්වාදිය හැකිය.

එසේම මෙම අස්ගිරිය විහාර භූමියෙහි රෙදි කර්මාන්ත ශාලාවක් පැවතියේ නම් මෙම ප්‍රදේශයේ වෙළදාම දියුණු තත්ත්වයක පැවති බව පෙන්වාදිය හැකි හැකි අතර එය මෙම භූමිය හරහා වැටී තිබූ බවට වන ජනවහරෙහි එන මාර්ගය සමග සැලකීමේදී පිළිගත හැකි කරුණක් බව පෙන්වාදිය හැකි ය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


දේවරක්ෂිත,බටුවන්තුඩාව., ශ්‍රී සුමංගල හිමි. (1996)*මහාවංසය සිංහල.ප්‍රථම භාගය.* කොළඹ 10: එස් ගොඩගේ සමාගම.

රණවැල්ල, සිරිනිමල්. (2004)*සිංහල සෙල්ලිපි වදන් අකාරාදිය.* පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

සුරවීර ඒ.වී. (1965)*අලකේශ්වර යුද්ධය.* කොළඹ: රත්න ප්‍රකාශන සමාගම.

# පුරාණ ඇත්ගාල ගම්මානය බිහිවීම පිළිබඳ ඓතිහාසික විමර්ශනයක්
## (පනාමුර නින්දගම ආශ්‍රයෙන්)

එම්.පී.එන්.ඩී. බණ්ඩාර[1], ඒ.ආර්.එල්.ඩී. නිල්මිණි[2],එම්.ජී.එස්. මධුවන්ති[3], ඒ.කේ.එම්.තරංගී[4], එම්.ඒ.එස්.එම්. මනතුංග[5], එන්.ටී.එස්.ඉරේෂා[6]

[1] ආර්ථිකවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය mahee0330@gmail.com
[2]ආර්ථිකවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය arldrathnayaka@gmail.com
[3]රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය mgshashikala1992@gmail.com
[4]ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය tharukathushan99@gmail.com
[5]රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය kshalikamadhuwanthi@gmail.com
[6]සමාජවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය isandhni407@gmail.com

ප්‍රමුඛ පදඃ හස්ති රාජයා, ඇත්ගාල, නින්දගම, දියබුබුළ, සංරක්ෂණය

**හැඳින්වීම**

දීර්ඝ වූ ප්‍රෞඪ ඉතිහාසයක් උරුම කරගන්නා ලද ශ්‍රී ලාංකේය අතීත උරුමයන් අපගේ දෙනෙතට දෘශ්‍යමාන වන තරමට වඩා සැඟවී ඇති තරම විශාල ය. වර්තමාන නාගරීකරණය යටතේ සියලු පුරාවිද්‍යා උරුමයන් විනාශ වී යන අතර ලාංකීය ඉතිහාසය විශාල ඛේදවාචකයකට හසු වී තිබේ. ඒ අනුව මෙම විමර්ශණයේ දී පනාමුර ඓතිහාසික ඇත්ගාල ගම්මානය ද එවන් වූ සැඟව ගිය ගම්මානයක් බැව් පෙනේ. වර්ෂ 1950 දී පනාමුර හස්ති රාජයාට වෙඩිතබා මරා දැමූ පසුව ලාංකීය ඉතිහාසය තුළ සුවිශාල ආන්දෝලනයක් ඇතිකරන ලද බැව් අවිවාදිත ය. ඇත්ගාල ගම්මානය බිහිවූයේ කෙසේ ද? යන්න අධ්‍යයන ගැටලුව පදනම්කර ගෙන මෙම පර්යේෂණය සිදු වේ. එකල ඇතුන් අල්ලාගත් අලිගාල පවත්වා ගෙන ගිය ප්‍රදේශය පසුකාලීනව ඇත්ගාල ගම ලෙස ප්‍රචලිත විය. පුරාණ ඇත්ගාල ගම්මානය බිහිවීමට පාදක වන ලද හේතු කාරණා පිළිබඳ විමර්ශනය මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. ඒ අනුව ඇඹිලිපිටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් පනාමුර ග්‍රාමසේවා වසම තුළ මෙම ඇත්ගාල ගම්මානය පිහිටා තිබෙන අතර එය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඓතිහාසික ගම්මානයක් ලෙස නම් කර ඇත. ඇත්ගාල ගම්මානය පිහිටා තිබෙන භූගෝලීය පරිසරය ඉතා සශ්‍රීක වූ ගොවි බිමක් බව සුපිරික්ෂාකාරී ලෙස නිරීක්ෂණයේ දී තහවුරු වේ.

**ක්‍රමවේදය**

මෙම පර්යේෂණය උදෙසා අධ්‍යයන ක්‍රමවේදය ලෙස ක්ෂේත්‍ර ගවේෂණ ක්‍රමය, ඉලක්කගත කණ්ඩායම් ක්‍රමය හා මූලාශ්‍ර අධ්‍යනය තුළින් ගුණාත්මක දත්ත රැස්කර ගන්නට පෙළඹුණි. ඉලක්කගත කණ්ඩායම ලෙසින් පනාමුර ශ්‍රී කාවන්තිස්ස රජ මහා විහාරයේ විහාරාධිපති හිමියන්, පනාමුර මහා විදුහලේ නූතන නියෝජ්‍ය විදුහල්පති තුමා සහ ඇත්ගාල ගම්වැසියෙකුවන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ විශ්‍රාමික අධ්‍යක්ෂකවරයෙකු ද තෝරාගෙන සම්මුක සාකාච්ඡා තුළින් අධ්‍යයනය සිදු කරන ලදී.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

ඓතිහාසික නගරයක් ලෙස නම්දරා තිබූ පනාමුර ප්‍රදේශය කන්ද උඩරට රාජ්‍ය ආරම්භයේදී දළඳා වහන්සේට පූජාකර තිබූ නින්ද ගමක් ලෙස ප්‍රසිද්ධ වේ. පනාමුර ප්‍රදේශයේ දිවි ගෙවි සොරෙකු වූ කටුවන කොටුවෙන් පලා ආවේයැයි